**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය - 2020**
**--------------------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 17 හි 4 වගන්තිය ප්‍රකාරව අධිකාරියෙහි වත්කමක් ලෙස හඳුනාගත හැකි සහශ්‍රපුර නිවාස ව්‍යාපෘතියේ පවතින අධිකාරියට අයත් වානිජ ස්ථාන (Commercial Unit) 68 ක හා සේවා ඒකක 57 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වා නොතිබුණු අතර එම ස්ථාන වලින් ලැබෙන කුලී/ බදු ආදායම අයකරගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | අධිකාරියට පැවරුණු වත්කම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධව අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීමේ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු. මිලියන 185.55 ක මුළු ණය ශේෂයට සියයට 5 ක අඩමාන ණය වෙන් කිරීම සිදු කර තිබුණු අතර ණය ගැතියන් අයකර ගැනීම් විශ්ලේෂණය කර අඩමාන ණය වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. | නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ දැනට ලැබිය යුතු සම්පූර්ණ ණයගැති ශේෂය සඳහා අඩමාණ ණය වෙන් කිරීම අධිකාරිය සිදු කෙරෙමින් පවතී. | ණයගැතියන්ගේ අය කෙරුණු අගය ණය ගැති ශේෂ විශ්ලේෂණය කිරීම තුළින් හඳුනා ගත යුතුය. |
| (ආ)සමාලෝචිත වර්ෂය අවසාන වන විට හලාවත, තලවකැලේ සහ අනුරාධපුර නාගරික නිවාස ව්‍යාපෘතියෙහි නිවාස 129 ක් නිවාස හිමියන්ට බැහැර කර තිබුණද එම නිවාස ව්‍යාපෘතිවලට අදාළ රු. මිලියන 39.81, ක් වූ නිවාස වල වටිනාකම් තවදුරටත් නිවාස තොගය යටතේ | මෙම ව්‍යාපෘති 3 ට අදාලව වරින් වර නිවාස බැහැර කර තිබුණද තවදුරටත් ඉතිරි නිවාස ප්‍රමාණයක් ද පවතී.<br>ඒ අනුව ගිවිසුම් ගතව බැහැර කර නොමැති නිවාස වල වටිනාකම ගිණුම්ගතව පවතී. | අයිතිය බැහැර කර ඇති නිවාස, නිවාස තොගයෙන් අඩුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු අතර සියළුම උපචිත වියදම් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| **(Housing Stock)** මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් නිවාස තොගයෙහි වටිනාකම එම වටිනාකමින්ම අධි ගණනය වී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය වෙනුවෙන් අධිකාරිය ගෙවිය යුතු අතිකාල දීමනා රු.300,752 ක් උපචිත වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2020 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව ගෙවිය යුතුව තිබූ අතිකාල වියදම උපචිත වියදමක් ලෙස ගිණුම් වලට ඇතුළත් කිරීමට කටයුතු කරමි. | |
| (ඇ) සාදා නිමකර නිවාස ලාභීන්ට ලබා දී ඇති අධිකාරියට අයත් නිවාස යෝජනා ක්‍රම 05 ක් ස්ථාපිත කර ඇති අක්කර 05 ක පමණ ඉඩම් සමාලෝචිත වර්ෂයේ අවසාන වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට තක්සේරු වාර්තා ලබා ගෙන ඇති ඉඩම් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර ඇත. | නිවාස යෝජනා ක්‍රම ආරම්භ කරනු ලබන ඉඩම් නියමිත පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) අස්පෘශ්‍ය වත්කම් යටතට ගැනෙන රු.500,000 ක් පිරිවැය වූ ගිණුම්කරණ පැකේජය දේපල, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | මෙම අස්පෘෂ්‍ය වත්කමට අදාල පිරිවැය පොත් වලට ගැනීම 2020.12.31 සිදු කර ඇති බැවින් වර්ෂයට අදාල ක්ෂය වටිනාකමක් නොමැත. | වත්කම් නිවැරදිව වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට හොරණ ව්‍යාපෘතියට අදාළව අධිකාරිය නිරවුල් කරන ලද රු.160,898 ක උපචිත වියදම් හොරණ නිවාස ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ ගිණුම තුළ දැක්වීම හේතුවෙන් එම ගිණුම එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි. | පොත් තැබීමේදි අදාල උපචිත ගිණුම තුළ ගැලපීම වෙනුවට මගහැරීමකින් වෙනත් ගිණුමකට හර වී ඇත. | කෙරීගෙන යන වැඩ වටිනාකම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) ඉකුත් වර්ෂය අවසානයට පැවති රු.161,000 ක උපචිත නීති ගාස්තු සමාලෝචිත වර්ෂයේදි නිරවුල් කර තිබුණද එය උපචිත වියදම් ගිණුමට ගැලපීමකින් තොරව නීති ගාස්තු ගිණුමට ගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ නීති වියදම එම වටිනකාමින්ම අධිගණනය වී තිබුණි. | ගණුදෙනු පිටපත් කිරීමේදි වැරදීමකින් අදාල උපචිත ගිණුමේ ගැලපීමට මග හැරී ඇති එම නීති ගාස්තු වටිනාකම නිවැරදි කිරීමට කටයුතු කරමි. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂයට වඩා ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල පිරිවැය රු.717,110 ක් අඩුවෙන් දැක්වුණු අතර එම වත්කම් හඳුනා ගැනීමට නොහැකිවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදි ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම වත්කම්වල පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල දක්වාද නොතිබීම | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව සියළුම භාණ්ඩ භෞතිකව හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කල බැවින් අධිකාරිය සතු සියළුම වත්කම් හඳුනාගනීමක් සිදු වේ. | වත්කම් හඳුනාගෙන සියළුම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| හේතුවෙන් වත්කම්වල වටිනාකම එම අගයෙන්ම ඌන ගණනය වී තිබුණි. | | |
| (ඌ) 2019 මැයි 22 දිනැති හා අංක අමප/19/1250/122/046 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පිරිවැය රු. මිලියන 8.79 ක් වූ අධිකාරිය විසින් ආරම්භ කරන ලද හොරණ නිවාස ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිවාස සංවර්ධන අධිකාරිය හරහා ක්‍රියාත්මක කිරීමට ඉකුත් වර්ෂයේදි එම අධිකාරියට පවරාදී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මූල්‍ය ප්‍රකාශයේ කෙරිගෙන යන වැඩ ගිණුම යටතේ එම නිවාස සඳහා මෙතෙක් දැරූ පිරිවැය දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති කෙරී ගෙන යන වැඩ එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි. | අදහස් දක්වා නැත. | නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා දී ඇති ව්‍යාපෘතියේ පිරිවැය අධිකාරියේ ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.5 අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16(3) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රු.මිලියන 5,000 ක් විය යුතු අතර එය කොටස් වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරියට කිසිදු ප්‍රාග්ධනයක්ලබාදී නොතිබුණි. | මේ සම්බන්ධයෙන් දිගින් දිගටම ඉල්ලීම් සිදු කළ අතර නාගරික සංවර්ධන අමාත්‍යාංශය හරහා ද මේ වන විට භාණ්ඩාගාරය වෙත ඉල්ලීමක් සිදු කර ඇත. | රජයේ ප්‍රාග්ධන දායකය අධිකාරිය වෙත ලබා ගැනීමට හෝ එසේ ලබාගැනීමට නොහැකි නම් සුදුසු පනත් සංශෝධනයක් මගින් වගන්තියේ විධිවිධාන සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16 (ඉ) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කරගනු ලබන සියලු මුදල් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අරමුදලට බැර කළ යුතුව තිබුණි. එසේ වුවත් 2010 දෙසැම්බර් 14 දිනැති අංක 10/2951/504/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නාගරික සංවර්ධන අධිකාරිය | අදහස් දක්වා නැත. | පනත අනුව අයවිය යුතු ආදායම් එකතු කිරීමට හෝ පනතේ එම විධිවිධානවලට අදාල වගන්ති සංශෝධනය කිරීමට හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

විසින් මෙම සේවා ගාස්තු අයකිරීම නවතා තිබුණු බැවින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට එම ආදායම් මාර්ගය අහිමි වී තිබුණි.

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විසිරි නිවාස ණය වැඩසටහනේ පළමු අදියර යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ණය වාරික වටිනාකම රු.28,185,096 ක් වූ අතර එයින් අවුරුදු 1 ත් අවුරුදු 2 ත් අතර ශේෂය රු.6,658,702 ක් ද අවුරුදු 2 ත් 5ත් අතර ශේෂය 11,059,074 ක්ද වසර 5 කට වඩා හිඟ හිටි ශේෂය රු.2,059,884 ක්ද විය. එමෙන්ම මෙම වැඩසටහනේ දෙවන අදියර යටතේ ලැබිය යුතු වාරික වටිනාකම රු.12,776,392 ක් වූ අතර එයින් අවුරුදු 1 - 2 ත් අතර ශේෂය රු. 3,270,671 ක්ද අවුරුදු 2 ට වැඩි ශේෂය රු.4,894,813 ක් ද විය. | ණය අයකර ගැනිම සදහා වෙනම අංශයක් මේ වන විට පිහිටුවා ඒ සදහා වෙනම කාර්ය මණ්ඩලයක්ද යොදවා ඇත. ඒ අනුව පසුවිපරම් ක්‍රියාවලිය ශක්තිමත් කිරිමටත් අය කිරිම් ප්‍රගතිය වැඩි කර ගැනීමටත් අධිකාරියේ අවධානය යොමු කර ඇත. | අයකර ගත යුතු ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) නිවාස ව්‍යාපෘති 4 ක විකුණුම් පදනම මත ලබාදුන් නිවාස සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට අය විය යුතු හිඟ ණය වාරික වටිනාකම රු.43,480,329 ක් වූ අතර ඉන් වර්ෂ 02 ත් 05 ත් අතර රු. 13,364,899 ක්ද වසර 5 ඉක්මවූ ශේෂය රු.19,217,258ක් ද විය. එමෙන්ම පුනස්ථාපන පදනම මත ලබාදුන් නිවාස සඳහා හිඟ කුලී ආදායම රු. 11,884,936 ක් වූ අතර ඉන් වර්ෂ 02- 05 ත් අතර රු. 3,171,868 ක් ද වර්ෂ 5 ඉක්ම වූ ශේෂය රු. 5,721,850 ක් ද විය. | ණය අය කර ගැනිම සදහා වෙනම අංශයක් මේ වන විට පිහිටුවා ඒ සදහා වෙනම කාර්ය මණ්ඩලයක්ද යොදවා ඇත. ඒ අනුව පසුවිපරම් ක්‍රියාවලිය ශක්තිමත් කිරිමටත් අය කිරිම් ප්‍රගතිය වැඩි කර ගැනීමටත් අධිකාරියේ අවධානය යොමු කර ඇත | අයකර ගත යුතු නිවාස ණය වාරික හා කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු අඟුලාන නිවාස කුලී ආදායම රු.60,881,263 ක් වුවද වර්ෂය තුළදී අයකර ගත් කුලී ආදායම රු.206,804 ක් පමණක් විය. | ණය අයකර ගැනිම සදහා වෙනම අංශයක් මේ වන විට පිහිටුවා ඒ සදහා වෙනම කාර්ය මණ්ඩලයක්ද යොදවා ඇත. ඒ අනුව පසුවිපරම් ක්‍රියාවලිය ශක්තිමත් කිරිමටත් අය කිරිම් ප්‍රගතිය වැඩි කර ගැනීමටත් අධිකාරියේ අවධානය යොමු කර ඇත. | අයකර ගත යුතු නිවාස කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට අධිකාරිය තාවකාලිකව සේවය අත්හිටවූ සහ සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අය විය යුතු ආපදා ණය ශේෂය රු.615,298 ක් වූ අතර මෙම ශේෂයෙන් රු.385,889 ක් වර්ෂ 1-2 ත් අතර කාලයක සිට ද රු.229,408 ක් වර්ෂ 2-5 ත් අතර කාලයක සිට ද පැවතුණු අතර 2021 ජූලි වන විටත් එම ශේෂයන් රු.271,490 ක හිඟ ශේෂය අයකර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිලධාරින්ගෙන් අයකර ගත යුතු නිවාස ණය ශේෂය රු.1,241,632 ක් වූ අතර 2021 ජූලි වන විටත් එම ශේෂයෙන් රු.873,769 ක් අයවී නොතිබුණි. | රු.615,298 ක් වූ හිඟ ශේෂයෙන් මේ වන විට සේවය අත්හිටවූ නිලධාරින්ගේ ශේෂයන් නිරවුල් කර ගෙන ඇති අතර ඇතැම් ණය ඇපකරුවන්ගෙන් ද අය කර ගැනීමට කටයුතු කර තිබේ. හිඟ මුදල් සම්බන්ධයෙන් නීති කටයුතු කිරීම කෙරේද පරිපාලනයේ අවධානය යොමු කර තිබේ. | සේවක ණය අදාළ ඇප කරුවන්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>-------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|
| (අ) අධිකාරිය විසින් ඉදිකිරීම් ව්‍යාපෘති 8 කට අදාළව ලබාගත් සේවා සඳහා ගෙවීමට ඇති මුදල් වලින් වසර 5 කට වඩා කල් ඉකුත් වී ඇති රු.124,842 ක් හා වසර දෙකක් ඉක්මවා ඇති රු. 922,276 ක් 2021 ජූලි වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති නියමිත කාල වලදී අවසන් නොවීම සහ පසුවිපරම් කටයුතු වල අඩුපාඩු හේතුවෙන් මෙම රැදවුම් මුදල් නිදහස් වීමේ ප්‍රමාදයක් පවතින අතර අවශ්‍ය සොයා බැලීම් සිදු කර නිරවුල් කිරීම සිදු කිරීමට ඉංජිනේරු අංශයට උපදෙස් ලබා දී ඇත. | මෙම මුදල් ගෙවීමට අදාළව තවදුරටත් වගකීමක් නොවේ නම් නැවත ආදායමට ලියා හැරීමට කටයුතු කළ යුතු අතර පසු විපරම් කටයුතු නිසි පරිදි සිදු නොකරන නිලධාරින් පිළිබඳවද අවධානය යොමුකළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පියවිය යුතු රු.1,344,641 ක් වූ රඳවා ගැනීමේ මුදල් වලින් වසර 2-5 අතර නොපිය වූ ශේෂය රු.922,276 ක් වූ අතර වසර 05 ට වැඩි ශේෂය රු.124,842 ක් විය. | ව්‍යාපෘති නියමිත කාල වලදී අවසන් නොවීම සහ පසුවිපරම් කටයුතු වල අඩුපාඩු හේතුවෙන් මෙම රැදවුම් මුදල් නිදහස් වීමේ ප්‍රමාදයක් පවතින අතර අවශ්‍ය සොයා බැලීම් සිදු කර නිරවුල් කිරීම සිදු කිරීමට ඉංජිනේරු අංශයට උපදෙස් ලබා දී ඇත. | මෙම මුදල් ගෙවීමට අදාළව තවදුරටත් වගකීමක් නොවේ නම් නැවත ආදායමට ලියා හැරීමට කටයුතු කළ යුතු අතර පසු විපරම් කටයුතු නිසි පරිදි සිදු නොකරන නිලධාරින් පිළිබඳවද අවධානය යොමුකළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවැති රු. මිලියන 3.47 ක සචලීයකරණ කොන්ත්‍රාත් අත්තිකාරම් මුදලින් රු. මිලියන 3.44 ක් වර්ෂ 1-5 ත් අතර කාලයක සිට නිරවුල්ව නොතිබුණි. | නිරවුල් කර නොමැති මෙම අත්තිකාරම් මුදල් 100% ක භෞතික ප්‍රගතියක් ලගා කර නොගත් ව්‍යාපෘතින්ට අයත් වේ. | මෙම මුදල් ගෙවීමට අදාළව තවදුරටත් වගකීමක් නොවේ නම් නැවත ආදායමට ලියා හැරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) (i) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත | නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවට සහතික වීම සඳහා අධිකාරිය ස්ථාපනය කර තිබුණද, අධිකාරිය පිහිටුවා වර්ෂ 12 ක් ගතවුවද මෙකී ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරිමට අධිකාරිය අපොහොසත්වී තිබුණි.<br>එසේම පනතේ 15 (අ) වගන්තිය ප්‍රකාරව නාගරික ජනාවාසවල ජීවන තත්ත්ව නගා සිටුවීම සඳහා නාගරික ජනාවාසවල ජීවත්වන ජනතාවගෙන් ලැබිය හැකි යෝජනා, සැලසුම්වලටද නිසි සැලකිල්ල ලබාදී මෙන් පසු, යෝජනා සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී වැඩ සටහන් සකස් කිරීම සහ ක්‍රියාවේ යෙදවීමට කටයුතු කළ යුතු බව දක්වා ඇතත් එවැනි ජන සහභාගීත්ව සංවර්ධන ක්‍රියාවලියක් ආරම්භ කිරීමට අධිකාරිය මෙම වසර 12 තුළම අසාර්ථකව ඇති බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත. | සංස්ථා පනතේ අරමුණුවලට අනුගත විය යුතුය. |
| (ii) 10 වන වගන්තිය | අධිකාරිය විසින් සභාපතිවරයකුද ඇතුළත් සාමාජිකයන් 14 දෙනෙකුට වැඩි නොවන උපදේශක කමිටුවක් 2017 අප්‍රේල් වන විට පත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරියේ යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී සැලසුම් යනාදී අධිකාරියේ අරමුණුවලට අදාල කාර්යයන් හඳුනාගෙන නොතිබුණි. | අදහස් දක්වා නැත. | සංස්ථා පනතේ අරමුණුවලට අනුගත විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) | මු.රෙ.104 | භාණ්ඩවල පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමටත්, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමත් සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරිය එලෙස හඳුනාගත් රු.115,000 ක අස්ථානගත වූ භාණ්ඩ සම්බන්ධව අදාල කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | අස්ථානගත වූ භාණ්ඩ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මු.රෙ. 371 (2) (ආ) | • අවස්ථා 13 කදී විවිධ කාර්යයන් සඳහා අධිකාරියෙහි නිලධාරින් විසින් ලබාගෙන තිබූ රු.133,900 ක අත්තිකාරම් මුදල් කිසිදු කාර්යයක් සඳහා යොදා නොගෙන මසකට වැඩි කාලයක් නිලධාරින් විසින් රදවාගෙන පසුව නිරවුල් කර තිබුණි. | • මෙවැනි කාර්යන් සිදු නොකිරීම කෙරේ සියළු අංශ වල අවධානය යොමු කර තිබේ .පැවති වසංගත තත්වයන් මත අත්තිකාරම් නිරවුල් නොවීමේ ප්‍රායෝගික තත්වයන්ද පැවතිණි. | සැලසුම් කළ කාර්යය සිදු නොවුන අවස්ථාවලදී ඒ සඳහා ලබාදුන් අත්තිකාරම් වහාම පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | මු.රෙ. 386 (7) | අවලංගු කරන ලද චෙක්පත් උප පත්‍රිකාවට අමුණා අදාළ චෙක්පොතෙහි තබා ගතයුතු වුවත් අධිකාරිය සමාලෝචිත වර්ෂයේදි අවලංගු කරන ලද රු.1,113,920 ක් වටිනා චෙක්පත් 03 ක් අවලංගුකිරීමේදි එලෙස කටයුතු කර නොතිබුණි. | මෙලෙස කටයුතු කිරීමට මග හැරී ඇති චෙක්පත් හදුනාගෙන අවශ්‍ය ඉදිරි කටයුතු කරමි. | චෙක්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) | මු.රෙ. 394 (ආ) | අවලංගු චෙක්පතක් වෙනුවට නව චෙක්පතක් නිකුත් නොකරන අවස්ථාවල එම චෙක්පත් අවලංගු කිරීම පිළිබඳ මුදල් පොතේ සහ බැංකු සැසඳුම් ප්‍රකාශවල සටහන් තැබිය යුතු වුවත් අධිකාරිය සමාලෝචිත වර්ෂයේදි අවලංගු කරන ලද රු.1,163,181 ක් වටිනා චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | මෙලෙස කටයුතු කිරීමට මග හැරී ඇති අවලංගු චෙක්පත් හදුනාගෙන අවශ්‍ය සටහන් තැබීමට ඉදිරි කටයුතු කරමි. | චෙක්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (v) | මු.රෙ. 756 (5) (ආ) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ වල නිවැරදි බව තහවුරු කිරීමට ටී සහ ඒ 66 අකෘති පත්‍රද, භාවිතා කළ නොහැකි භාණ්ඩ ගැන වාර්තා කිරීම සඳහා පොදු 47 ආකෘති පත්‍රයද භාවිතා කළ යුතු වුවත් අධිකාරිය භාණ්ඩ සමීක්ෂණයේදී එම අකෘති පත්‍ර භාවිතා කර නොතිබුණි. එම හේතුවෙන් ඉන්වෙන්ට්‍රි භාණ්ඩවල අතිරික්ත සහ ඌණතා හඳුනා ගැනීමට අධිකාරියට නොහැකි වී තිබුණි. | අදහස් දක්වා නැත. | භාණ්ඩ සමීක්ෂණයේදී නියමිත අකෘති පත්‍ර භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (vi) | මු.රෙ 770 | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් භාවිතයට ගත නොහැකි භාණ්ඩ නුසුදුසු භාණ්ඩ ලෙස හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | භාවිතයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අංක පීඒඩී/12 සහ 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදය | රාජ්‍ය ආයතනයක සේවයේ නියුතු සේවකයින් අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව වෙනත් ආයතනයක් වෙත මුදා හැරීම හා එම කාල සීමාවන් සඳහා දීමනාවන් ගෙවීම සිදු නොකළ යුතු වුවද නිසි අධිකාරී බලයකින් තොරව රජයේ ව්‍යාපෘතියකට සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් සිට අනුයුක්ත කළ සේවකයින් දෙදෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් වශයෙන් රු.174,896 ක්ද අතිකාල දීමනා ලෙස රු.63,488 ක් හා රු.10,000 ක උත්සව අත්තිකාරම් වශයෙන් එකතුව රු248,384 ක් අධිකාරිය ගෙවා තිබුණි. එසේම මෙම සේවකයින් දෙදෙනා 2021 අප්‍රේල් 01 දින සිට අනුප්‍රාප්තිකයකු රහිතව එම ව්‍යාපෘතියට අනුයක්ත කිරීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය. | සේවකයන් වෙනත් ආයතන වලට මුදා හැරීමේදී එම සේවකයින්ගේ අනුයුක්ක කිරීම පිළිබඳ අදාළ අංශ දැනුවත් කිරීම මෙහිදී සිදු වී නොමැති වීම නිසා අදාළ ගෙවීම් සිදුව තිබේ. | වෙනත් කාර්යයන් හෝ ආයතන වෙත නිලධාරීන් මුදා හැරීමේදී සහ ගෙවීම් කිරීමේදී චක්‍රලේඛයේ නියමයන්ට අනුව හා ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර | ඉකුත් වර්ෂවල විගණන වාර්තාවලින්ද පෙන්වා දී තිබුණද අධිකාරිය විසින් පොදු ආකෘති 287 ප්‍රකාරව ස්ථාවර | අධිකාරිය පරිගණක ගතව ස්ථාවර වත්කම් ලේඛනයක් අවශ්‍ය තොරතුරු ඇතුළත් කරමින් පවත්වා | නියමිත පරිදි වත්කම් ලේඛන |

| | | | |
|---|---|---|---|
| චක්‍රලේඛ | වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ගෙන යනු ලබයි. ඒ අනුව මුද්‍රිත පිටපතක් ද නඩත්තු කරයි. | නඩත්තු කළ යුතුය. |
| (ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.3.1 (ආ) ඡේදය | ඉදිකිරීම් ප්‍රසම්පාදන කටයුත්තක් ආරම්භ කිරීමට පෙර, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ඉදිකිරීමට අදාළ ඉඩම් අත්කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ඇති බව සහ ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු කරුණු ඉටුකර තිබිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලුනාව නිවාස ව්‍යාපෘතියට අයත් ඉඩම් අත්කර ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | ලුනාව නිවාස ව්‍යාපෘතිය පිහිටි ඉඩම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත 2021.04.07 දින පවරාගෙන ඇත. නිවාස සඳහා සම්පූර්ණ මුදල් ගෙවා අවසන් කරන ලද ප්‍රතිලාභීන් වෙත ගිවිසුමක් ලබා දී ඇත. (සහාධිපත්‍ය ප්‍රකාශය ලියාපදිංචි කිරීමෙන් අනතුරුව ඔවුන් වෙත ලබා දීමට නියමිත වේ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,170,456 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,282,734 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 8,112,278 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පුනරාවර්ථන සහ මානව සංවර්ධන වැඩ සටහන් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද ලැබීම් අඩුවීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

------------------------------------------------------------------------

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී මහා භාණ්ඩාගාර පුනරාවර්තන ප්‍රදාන රු. මිලියන 24 කින් හෙවත් සියයට 16 කින් අඩු වී තිබුණු අතර ගොඩනැගිලි අළුත්වැඩියාව වියදම සියයට 218 කින්ද, වෙනත් වියදම් (සැපයුම්) සියයට 158 කින්ද, ලිපි ද්‍රව්‍ය වියදම සියයට 51 කින්ද ඉහල ගොස් තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන හැර අධිකාරියේ ශුද්ධ වත්කම් රු. මිලියන 180 ක පහළ අගයක පැවතුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

-------------------------

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ශුද්ධ අතිරික්ත අනුපාතය සියයට 79 කින් අඩු වී තිබුණු අතර පුනරාවර්ථන වියදම් වෙනුවෙන් සහ මානව සංවර්ධන වැඩ සටහන වෙනුවෙන් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම් රු.මිලියන 64.6 කින් අඩු වීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය සමාලෝචිත වර්ෂයේදි වාසිදායක මුලා කළමනාකරණ පරිචයක් ක්‍රියාත්මක නොකිරිම හේතුවෙන් අධිකාරියේ ජංගම ගිණුම්තුළ වර්ෂය පුරා රු.මිලියන 42 ක් පමණ අක්‍රියව පවත්වා ගෙන ගොස් තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී අධිකාරියට අහිමි වූ පොලි ආදායම රු. මිලියන 3.7 ක් පමණ විය. | මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් අධිකාරියේ ජංගම ගිණුම් ශේෂ තුළ ඇතුළත්ව පවති. වාර්ෂික වැඩ සටහන් සැලසුම් කළ කාල වලදි ක්‍රියාත්මක නොකිරීම හෝ අවසන් නොවීම තුළ මුදල් ශේෂ පැවතියද අනපේක්ෂිතව ඕනෑම අවස්ථාවකදි ප්‍රමාද වූ බිල්පත් හදිසි ගෙවීම් වශයෙන් ඉදිරිපත් වේ. ඒ අනුව ආයෝජන කාලසීමාවක්ද තීරණය කළ නොහැකි නියමිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මහාභාණ්ඩාගාරයෙන් ලබා දෙන මෙවැනි ප්‍රතිපාදන ඉතුරුම් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගෙන නොතිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල තිරණය මත මේ වන විට මුදල් ශේෂ ස්ථිර තැන්පතු වල අයෝජනය කර ඇත. | අතිරික්ත මුදල් කෙටි කාලිනව හෝ ආයෝජනය කර ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ සිදු වූ පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් වූ පවුල් සවිබල ගැන්වීමට අධිකාරිය ක්‍රියාත්මක කළ මානව සංවර්ධන වැඩ සටහන සඳහා අමාත්‍ය මණ්ඩලය රු. මිලියන 94.81 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසාන වන විටත් එම වැඩ සටහන වෙනුවෙන් දරන ලද වියදම රු. මිලියන 20.83 ක් පමණක් වූ අතර සමාලෝචිත වර්ෂයේදි යථෝක්ත විෂයයට අදාළව කිසිදු වැඩ සටහනක් ක්‍රියාත්මක කර ද නොතිබුණි. | අදහස් දක්වා නැත. | අධිකාරියේ විෂය පථයට නොගැළපෙන මෙවැනි කටයුතු සම්බන්ධව තවදුරටත් විමර්ශණය කර අමාත්‍ය මණ්ඩලය වෙන් කළ මුදල් වැය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සයුරුපුර, තුරුඉතුරුගම, තලවාකැලේ හා රජ්ගම නිවාස ව්‍යාපෘති වලට අදාළ නිවාස 45 ක සහ වෙළඳසැල් 03 ක ප්‍රතිලාභීන් නොවන භාහිර පුද්ගලයන් සිටින බව විගණනයේදී අනාවරණය වූ අතර මෙම පුද්ගලයින් ඉවත් කිරීමට අධිකාරිය සාධනීය පියවර ගෙන නොතිබුණි. | සයුරුපුර හා තුරුඉතුරුගම නිවාස යෝජනා ක්‍රම වල කුලියට ලබා දී ඇති නිවාස සහ අනවසර පදිංචිකරුවන්ට එරෙහිව දැනටමත් නීත්‍යානුකූල කටයුතු ආරම්භ කර ඇත. | අධිකාරියේ අරමුණුවලට අනුව තෝරා ගත් ප්‍රතිලාභීන්ට පමණක් අදාළ දේපළ භාවිතා කිරීමට ඉඩදිය යුතු අතර බාහිර පුද්ගලයන් දේපළ පරිහරණය කිරීම සම්බන්ධව අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. |
| (ආ) ලුනාව අඩු ආදායම් ලාභී නිවාස යෝජනා ක්‍රමයේ සමාරම්භක උත්සවය සඳහා සමාලෝචිත වර්ෂයේදි රු. මිලියන 4.03 ක වියදමක් දරා තිබුණද ඒ සඳහා අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. එමෙන්ම එම වියදම නිවාස යෝජනා ක්‍රමයේ කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම් ගත කරද තිබුණි. | ව්‍යාපෘතින් සමාරම්භක උත්සවයේ පරිපාලන වියදම් දැරිම, ණය අයකිරීම් තුළින් සිදු කිරීමට ඉහල කළමණාකාරිත්වය තිරණය කර ඇති අතර ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත. නමුත් මේ වන විට ස්ථාවර ආදායම් මත අරමුදල පිහිටුවා ඇත. පනතේ අරමුණ හා කාර්යභාරයන් ඉටු කිරිම සඳහා මෙම අරමුදල යොදා ගනි. | සමාරම්භක උත්සව වෙනුවෙන් ආර්ථිකමය නොවන වියදම් දැරීම සිදු නොකළ යුතුය. |

### 3.4 කොන්ත්‍රාත් ක්‍රියාවලිය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 14.19 ක් වූ අඟුලාන සයුරපුර මහල් නිවාස සංකිර්ණයේ සුහසාධක ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ කළ වැඩ වටිනාකම රු. මිලියන 5.85 ක්ව පැවතියේදි ව්‍යාපෘතිය ඉකුත් වර්ෂයේදි අත්හැර දමා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙවන ලද රු. මිලියන 2.26 ක වැඩ පූර්ව අත්තිකාරම් නැවත අයකර ගැනීමට අධිකාරියට නොහැකිවී තිබුණි. කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් වැඩ අතර මඟ නතර කිරීම මෙම තත්ත්වයට ඍජුව බලපා තිබුණි. | අදහස් දක්වා නැත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර අධිකාරියට සිදු වී ඇති අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සහස්පුර මහල් නිවාස සංකීර්ණය අළුත්වැඩියා කටයුතු 2017 වර්ෂයේ අවසන්ව තිබුණද, එදිනට පැවැති කොන්ත්‍රාත්තුවේ අඩුපාඩු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කොන්ත්‍රාත්කරු මගින් නිවැරදි කර ගැනීමට (Rectify) අධිකාරිය අපොහොසත්ව තිබුණු අතර කොන්ත්‍රාත්කරුට තවදුරටත් ගෙවිය යුතු රු. මිලියන 8.80 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | කොන්ත්‍රාත්තුවේ අඩුපාඩු නිවැරදි කරගෙන කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු මුදල් නිරවුල් කළ යුතුය. |

**3.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 171 ක් වූ අතර එදිනට තථ්‍ය කාර්යමණ්ඩලය 103 ක් වීමෙන් අධිකාරියේ කාර්ය මණ්ඩලයේ 68 ක පුරප්පාඩු හා අතිරික්ත 03 ක් විය. | අදහස් දක්වා නැත. | අදාළ පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක DMS/1523(Vol – 1) සහ 2019 මැයි 22 දිනැති ලිපිය මගින් අධිකාරියේ අනුමත තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පරිපාටිය පැරණි ආකෘතියට අනුව සකස් කරන ලද්දක් බැවින් එය නව ආකෘතිය අනුව යාවත්කාලීන කර ඇනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස දන්වා ඇතත්, 2021 ජූලි වන විටත් එම අවශ්‍යතාව ඉටුකර නොතිබුණි. | අදහස් දක්වා නැත. | අදාළ ආකෘති ලබාදී ඇති උපදෙස් වලට අනුව සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

**4.1 සංයුක්ත සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 අනුව සංයුක්ත සැලැස්මට ඇතුළත් වියයුතු සංයුක්ත සැලැස්මේ ඒ ඒ කාර්යන් සඳහා වගකීම පැවරී ඇති නිළධාරීන් හඳුනාගැනීම | වර්තමානයේ පවතින භෞතික හා මානව සම්පත් පසුගිය වසර **03** ක මෙහෙයුම් ප්‍රතිඵලවල ප්‍රගතිය සංයුක්ත සැලැස්මට ඇතුළත් කර ඇත. ඉහත චක්‍රලේඛයට | භාණ්ඩාගාරයේ සහ අමාත්‍යාංශයේ උපදෙස් වලට අනුව සංයුක්ත සැලසුම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වැනි තොරතුරු ඇතුළත් කර සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි. | අමතරව සංයුක්ත සැලැස්ම සකස් කිරීම සම්බන්ධයෙන් අදාළවන නව චක්‍රලේඛය වන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2014 අනුව දැනට පවතින සංයුක්ත සැලැස්ම **(**2021- 2025**)** සකස් කර ඇත**.** | |
| (ආ) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනතට අනුව ඉටු කළ යුතුපහත සඳහන් කාර්යයන් සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | | පනතේ විධිවිධානවලට අනුව ඉටු කළ යුතු කාර්යන්ද සංයුක්ත සැලසුමට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (i) නාගරික පදිංචිකරුවන්ගේ ආර්ථික හා සමාජීය තත්ත්වය හඳුනාගැනීමට අදාල වන සමීක්ෂණ හා අධ්‍යනය කටයුතු පැවැත්වීම. | (i) අධිකාරියෙහි ව්‍යාපෘති යෝජනා පිළියෙල කිරීමේදී දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලබන සමාජ, ආර්ථික සමීක්ෂණයෙහි තොරතුරු සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීමේදී ඇතුළත් කිරීමට අපේක්ෂිතය. | |
| (ii) ජාතික වශයෙන් අදාලවන නාගරික නිවාස ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම. | (ii) දීප ව්‍යාප්ත විසිරී පවතින නාගරික කලාප තුළ පිහිටි අර්ධ නිමි නිවාස/ අබලන් වූ නිවාස නිමි නිවාස බවට පත් කරමින් නාගරික නිවාස සංචිතය සඳහා ප්‍රමිතිගත නිවාස එක් කිරීම අරමුණු කරගත් ''සතුටු පවුලක් - සෞභාග්‍යමත් නිවසක්'' නිවාස ණය වැඩසටහන සංයුක්ත සැලැස්ම සඳහා ඇතුළත් කිරීමට නියමිතය. | |

## 4.2 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2008 අංක 36 දරණ අධිකාරි පනත අනුව නාගරික අඩු ආදායම් ලාභී ප්‍රජාවගේ භෞතික , සමාජ හා ආර්ථික තත්ත්වය නගා සිටුවීම අරමුණු කර ගනිමින් භෞතික සංවර්ධන ව්‍යාපෘතින් හා මානව සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදි කිසිදු භෞතික සංවර්ධන කටයුත්තක් සිදු නොකර තිබුණ අතර මානව සංවර්ධන වැඩ සටහන් 06 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි | 2020 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුව මානව සංවර්ධන වැඩසටහන තුළ ''දිරිය නිවස'' භෞතික සංවර්ධන වැඩසටහන ඇතුළත් විය. ඒ යටතේ තලවකැලේ නිවාස ව්‍යාපෘතිය සම්බන්ධ ක්‍රියාකාරකම් ඇතුළත් කරන ලදී. | ක්‍රියාකාරී සැලැසුම යථාර්තවාදී ලෙස පිළියෙල කර අදාළ කාර්යයන් සැලැසුමට අනුව ඉටු කිරීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 9 ක් වූ හලාවත හා තලවකැලේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩසටහන සමාලෝචිත වර්ෂය තුළ ඉටු කර නොතිබුණි. | 2020 ක්‍රියාකාරී සැලස්මට අනුව හලාවත නිවාස ව්‍යාපෘතියේ අලුත්වැඩියා කටයුතු සඳහා අභ්‍යන්තර ඉපයීම් මගින් රු.මිලි 4.35 ක් ද තලවකැලේ නිවාස ව්‍යාපෘතිය සඳහා මානව සංවර්ධන වැඩසටහන සඳහා ලබා දෙන ලද ප්‍රතිපාදන තුළින් රු.මිලි 2.00 වෙන් කර තිබුණි. | ක්‍රියාකාරී සැලැසුම යථාර්තවාදී ලෙස පිළියෙල කර අදාළ කාර්යයන් සැලැසුමට අනුව ඉටු කිරීමට පියවර ගත යුතුය. |

## 4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අනුමත කාර්ය මණ්ඩලය තුළ විගණන අංශය වෙනුවෙන් අභ්‍යන්තර විගණක තනතුර පමණක් අනුමත කර තිබුණු අතර මේ පිළිබඳව පසුගිය විගණකාධිපති වාර්තාවලින්ද පෙන්වාදී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළ හෝ අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර ප්‍රධාන අභ්‍යන්තර විගණන තනතුර මධ්‍යම කළමණාකරන මට්ටමේ (MM) තනතුරක් ලෙස පැවතීම සහ එම අංශයට කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙකු පමණක් අනුයක්ත කර තිබුණි. | අදහස් දක්වා නැත. | අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ කොටසක් ලෙස අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අනුමත විගණන සැලැස්මෙහි ඇතුළත් විගණන වැඩසටහන්වලින් ඇතැම් ව්‍යාපෘතිවල කාර්ය සාධන අගැයීමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | විගණන සැලැසුමට අනුව අදාළ කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.4 තිරසර සංවර්ධ අරමුණු ලඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය"අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් තිරසර සංවර්ධන අරමුණු 02 ක් පමණක් හදුනාගෙන තිබුණු අතර එම අරමුණුවලට අදාළ ඉලක්ක මැනීම සඳහා යොදාගනු ලබන පාදක දත්ත හදුනාගෙන නොතිබුණු අතර වර්ෂ 2025 න් පසුව ලඟාකර ගත යුතු ඉලක්කයන්ද හදුනාගෙන නොතිබුණි. | නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ක්‍රියාකාරීත්වයට අදාලව තිරසර සංවර්ධන ඉලක්ක 1 (දිළිදුකම දුරලීම) සහ තිරසර සංවර්ධන ඉලක්ක 11 (තිරසාර නගර හා ප්‍රජාවන්) යන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු ආකාරය හඳුනාගෙන වැඩසටහන් 2025 තෙක් හඳුනාගෙන ක්‍රියාත්මකවීම සිදු වේ.<br>දීප ව්‍යාප්ත සමීක්ෂණය මඟින් නාගරික අඩු පහසුකම් ප්‍රජාවගේ සමාජ ආර්ථික තොරතුරු රැස්කර, එම පාදක දත්ත මත 2030 දක්වා ලඟා කරගත යුතු ඉලක්ක හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ. | තිරසර සංවර්ධන අරමුණු හදුනාගෙන එම අරමුණු කරා ළගා වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4.5 නොවිසඳී ඇති විගණන ඡේද

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අඟුලාන නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා රු.1,179,062,714 ක් වියදම් කර තිබුණද කිසිදු ප්‍රතිපත්තිමය තීරණයකින් තොරව රු.700,074,056 ක් ලාභයට එරෙහිව කපාහැර එම නිවාසවලට අයකරන වටිනාකම වූ රු.478,988,658 ක් පමණක් වත්කම්ලෙස දක්වා තිබීම හේතුවෙන් අධිකාරියේ ජංගම නොවන වත්කම් රු.684,298,437 කින් ඌන ගණනය වීම. | අදහස් දක්වා නැත. | මේ සම්බන්ධ පැහැදිලි කිරීම් හා ඇති වී ඇති බලපෑම පිළිබඳ විස්තර කළ යුතුය |
| (ආ) අධිකාරියේ කාර්යාල ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවිය යුතු රු.3,891,911 ක් නිරවුල් නොකර ආදායමට බැර කිරීම. | අදහස් දක්වා නැත. | මේ පිළිබඳ අදාළ සංස්ථාවෙන් විමසා කටයුතු කළ යුතුය. |